සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 2025
# Second Term Test - 2025

10 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය - I | කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. අතීත කෘෂිකර්මාන්තයේදී වැව් බැඳි රාජ්‍ය ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) රජරට ය. (2) වෙල්ලස්ස ය. (3) උඩරට ය. (4) පහතරට ය.

02. වාරි තාක්ෂණයට අනුව දිය බැස්ම ඉතා සූක්ෂම ලෙස සකස් කර ඇති ඇළ මාර්ගයක් වන්නේ,

(1) ඇළහැර ඇළය (2) යෝධ ඇළය (3) රිදීබැඳි ඇළය (4) මිනිපේ ඇළය

03. විදේශීය ජාතීන් විසින් කුරුඳු වගාවක් ලෙස ප්‍රථමයෙන් ආරම්භ කරන ලද ප්‍රදේශවලට උදාහරණයකි.

(1) ගම්පහ සහ ජාඇලය
(2) මීගමුව සහ මීනුවන්ගොඩය
(3) කදිරාන සහ ඇවරිවත්තය
(4) කුරුඳුවත්ත සහ ජා ඇලය

04. බ්‍රිතාන්‍යයන් විසින් පනවනු ලැබූ මුඩු බිම් පනත මගින් අපේක්ෂා කළ කරුණක් **නොවන්නේ**,

(1) වගා නොකල ඉඩම්වල අයිතිය රජයට ලබාගැනීම ය.
(2) ගොවි ජනතාව සඳහා ඉඩම් ලබා දීමය.
(3) වැවිලි බෝග සඳහා ඉඩම් ලබා ගැනීමය.
(4) වගාවන් සඳහා යොදා ගන්නා ඉඩම්වලට බදු සහන ලබා දීමය.

05. රඹුටන්, අන්නාසි හා තක්කාලි යන වගාවන් ලංකාවට හඳුන්වා දුන් ජාතීන් පිළිවෙලින් දැක්වෙන වරණය වනුයේ,

(1) පෘතුගීසීන් හා ඉංග්‍රීසීන්ය
(2) ඉංග්‍රීසීන් හා ලන්දේසීන්ය
(3) ඉංග්‍රීසීන් හා ඉන්දියානුවන්ය
(4) ලන්දේසීන් හා පෘතුගීසීන්ය

06. වර්ෂාමානයක් ස්ථානගත කිරීමකදී පොළව මට්ටමේ සිට පුනීලයේ කට දක්වා ඇති උස ප්‍රමාණය,

(1) සෙ.මීටර් 25 කි (2) සෙ.මීටර් 20 කි (3) සෙ.මීටර් 40 කි (4) සෙ.මීටර් 30 කි

07. දී ඇති උපකරණය මගින් මනිනු ලබන කාලගුණික පරාමිතිය වනුයේ,



(1) දෛනික උෂ්ණත්වය
(2) උපරිම හා අවම උෂ්ණත්වය
(3) සාපේක්ෂ ආර්ද්‍රතාවය
(4) පාංශු උෂ්ණත්වය

08. ප්‍රභාසංස්ලේෂණ කාර්යක්ෂමතාවය වඩාත් හිතකර අන්දමින් සිදුවන උෂ්ණත්ව පරාසය වනුයේ,

(1) $20\ C^0$ - $25\ C^0$ අතරය.
(2) $21\ C^0$ - $31\ C^0$ අතරය.
(3) $22\ C^0$ - $27\ C^0$ අතරය.
(4) $24\ C^0$ - $30\ C^0$ අතරය.

09. දෙවන අන්තර් මෝසම් සෘතුවට අදාල මාස පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න,

(1) මාර්තු, අප්‍රේල්ය.
(2) ඔක්තෝම්බර්, නොවැම්බර්ය.
(3) අප්‍රේල්, මැයිය.
(4) නොවැම්බර්, දෙසැම්බර්ය

10. පහත ප්‍රස්ථාර අතරින් වියළි කලාපයේ වර්ෂාපතන රටාව දක්වෙන නිවැරදි ප්‍රස්ථාරය තෝරන්න,

(1) 


(2) 


(3) 


(4) 


11. මාස් කන්නයට වගා කළ වී බෝගයක අස්වනු නෙළීම සිදුකරන මාස වනුයේ,

(1) අගෝස්තු හා සැප්තැම්බර්ය. (2) ජුනි හා ජූලිය.

(3) මාර්තු හා අප්‍රේල්ය. (4) ජනවාරි හා පෙබරවාරිය.

12. පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය සහිත නිවැරදි පිළිතුර තෝරන්න,

(1) පාෂාණ → පාංශු ජනනය → මාතෘ ද්‍රව්‍යය → පාෂාණ ජීර්ණය → පස

(2) මාතෘ ද්‍රව්‍යය → පාංශු ජනනය → පාෂාණ → පාංශු ජීර්ණය → පස

(3) පාෂාණ → පාංශු ජනනය → මාතෘ ද්‍රව්‍යය → පාෂාණ ජීර්ණය → පස

(4) පාෂාණ → පාෂාණ ජීර්ණය → මාතෘ ද්‍රව්‍යය → පාංශු ජනනය → පස

13. ආග්නේය පාෂාණ සඳහා උදාහරණයකි,

(1) ග්‍රැනයිට් හා තිරුවානාය. (2) ෂෙල් හා හුණුගල්ය.

(3) ෂෙල් හා පෙග්මටයිට්ය. (4) නයිස් හා කිරිගරුඬය.

14. පාංශු වර්ගීකරණය අනුව මි. මී. 0.002 ට වඩා කුඩා අංශු අයත් ඛනිජ වර්ගය වන්නේ,

(1) සියුම් වැලියි. (2) මැටිය. (3) රළු වැලිය. (4) රොන් මඩය.

15. පසක ජලාකර්ෂණ ජලය කේෂාකර්ෂණ ජලය සහ ගුරුත්වාකර්ෂණ ජලය උපරිම ධාරිතාවයෙන් පවතින අවස්ථාව වන්නේ,

(1) ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවය (2) සම්තෘප්ත අවස්ථාවය

(3) තාවකාලික මැලවීමේ අවස්ථාවය (4) ස්ථිර මැලවීමේ අවස්ථාවය

16. පාංශු ජීවීන්ගෙන් පසට සිදුවන වාසියක් **නොවන්නේ**,

(1) කාබනික ද්‍රව්‍ය වියෝජනය කිරීම. (2) කැටිති ඇති කිරීම.

(3) නයිට්‍රිකරණය සිදුකිරීම. (4) නයිට්‍රිහරණය සිදුකිරීම.

17. ආනයන ආර්ථික බෝග කාණ්ඩයට අයත් බෝග සහිත පිළිතුර තෝරන්න,

(1) ගම්මිරිස්, කුරුඳු, පුවක්ය. (2) ඇන්තූරියම්, ඕකිඩ්, ජර්බේරාය.

(3) තේ, පොල්, රබර්ය. (4) කහ, මිරිස්, ගම්මිරිස්ය.

18. පොල්, පුවක්, කිතුල් යන බෝග අයත් වන ශාක කුලය වන්නේ,

(1) බ්‍රැසිකේසියේ ය. (2) රුටේසියේ ය. (3) ඇරිකේසියේ ය. (4) මැල්වේසියේ ය.

19. විද්‍යාත්මක වර්ගීකරණයේ මූලිකයා ලෙස හඳුන්වනු ලබන විද්‍යාඥයා වන්නේ,

(1) මාරි කියුරිය. (2) අයිසෙක් නිවුටන්ය.

(3) කැරෝලස් ලිනේයස්ය. (4) නිකොලා ටෙස්ලාය.

20. කොළ පොහොර හා ඉඩම්වල සෝදාපාලුව වැළැක්වීම සඳහා යොදා ගන්නා ශාක කාණ්ඩ කුමන වර්ගීකරණයට අයත්වේද?

(1) ප්‍රයෝජන අනුවය. (2) වැඩෙන පරිසරය අනුවය.

(3) බෝගවල වයස අනුවය. (4) බෝගවල වර්ධක විලාශය අනුවය.

21. බිම් සැකසීමේ අරමුණක් **නොවන්නේ**,

a) පසෙහි ගල්මුල් ආදිය පසෙන් ඉවත් කිරීම

b) පළිබෝධ පාලනය කිරීම

c) ඒ ඒ බෝගයට උචිත පරිදි භූමිය සකස් කිරීම

(1) a පමණි. (2) b පමණි. (3) c පමණි. (4) a, b හා c සියල්ලමය.

22. බිම් සැකසීමේ පියවර ලෙස හඳුන්වන්නේ,

(1) මූලික බිම් සැකසීම හා අතුරුයත් ගෑම වේ.

(2) අතුරුයත් ගෑම හා ද්වීතියික බිම් සැකසීම වේ.

(3) ප්‍රාථමික බිම් සැකසීම හා අතුරුයත් ගෑම වේ.

(4) ප්‍රාථමික බිම් සැකසීම හා ද්වීතියික බිම් සැකසීම වේ.

23. උස් වූ පාත්ති හා ගිල්වූ ,පාත්ති වල සිටුවීමට යෝග්‍ය බෝග පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න,

(1) ගොටුකොළ හා රාබු (2) කංකුන් හා කැරට්

(3) රාබු හා කංකුන් (4) ගොටුකොළ හා කැරට්

24. බෝග සංස්ථාපන ක්‍රම තෝරා ගැනීමේදී සලකා බලන ප්‍රධාන සාධකය වනුයේ,

(1) ප්‍රරෝහණයේ පහසු බව වේ. (2) මූල වර්ධනයට ප්‍රමාණවත් ඉඩකඩ පිළිබඳව වේ.

(3) රෝපණ ද්‍රව්‍යවල ස්වභාව වේ. (4) පළිබෝධ හානි අවම කිරීම වේ.

25. වැටි හා කාණු දැමීම සඳහා භාවිතා කරනු ලබන උපකරණය වනුයේ,

(1) රේක්කයයි. (2) රිජරයයි. (3) භ්‍රමණ පෝරුවයි. (4) හෝ උපකරණයයි.

26. දෙපේලි ක්‍රමයට බෝග සංස්ථාපනය සිදුකරනු ලබන බෝගය වන්නේ,

(1) අන්නාසිය. (2) කෙසෙල්ය. (3) රඹුටන්ය. (4) අඹය.

27. පහත සඳහන් ක්‍රියාකාරකම් අතුරෙන් ද්වීතියික බිම් සැකසීමට අයත් කාර්ය පමණක් අඩංගු වරණය තෝරන්න,

(1) පැළ අවට පස් බුරුල් කිරීම හා පසට පොහොර මිශ්‍ර කිරීම.

(2) වල්පැළෑටි පාලනය හා පැළ මුලට පස් එකතු කිරීම.

(3) පස් පිඩැලි කැපීම, පෙරළීම හා පසට කාබනික ද්‍රව්‍යය මිශ්‍ර කිරීම.

(4) පෙරළන ලද පස් පිඩැලි පොඩි කර සමතලා කිරීම හා පාත්ති සැකසීම.

28. තවාන් දැමීමකින් තොරව සෘජුවම ක්ෂේත්‍රයේ සිටුවන බෝග වර්ග වන්නේ,

(1) මෑ හා බණ්ඩක්කාය. (2) කැරට් හා නෝකෝල්ය.

(3) මෑ හා කැරට්ය. (4) බණ්ඩක්කා හා නෝකෝල්ය.

29. තවාන් සැකසීමේ පියවර පහත දක්වා ඇත. එහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න,

a) සුදුසු ස්ථානයක් තේරීම. b) තවාන් ජීවාණුහරණය කිරීම.

c) රෝපණ ද්‍රව්‍යය සංස්ථාපනය. d) තවාන් මිශ්‍රණය හා තවාන පිළියෙල කිරීම.

(1) a, b, c හා d වේ. (2) a, d, b හා c වේ. (3) a, c, b හා d වේ. (4) d, a, c හා b වේ.

30. තවාන් තැටි භාවිතා කරනු ලබන්නේ කුමන බෝග පැළ ලබා ගැනීම සඳහා ද?

(1) ගෝවා සහ මෑ. (2) මෑ සහ වැටකොළු.

(3) කව්පි සහ මෑ. (4) ගෝවා සහ තක්කාලි.

31. පැළ 'දැඩි කිරීම' මගින් ලබාගත හැකි අරමුණු වන්නේ,

a) ක්ෂේත්‍රයේ සිටවීමට සුදුසු තත්ත්වයට ක්‍රමයෙන් හුරු කරවීමය

b) තවානට ජලය යොදන වාර ගණන වැඩි කිරීමය

c) ක්‍රමයෙන් සූර්යාලෝකයට පැළ නිරාවරණය වන කාලය අඩු කිරීමය.

d) ජලය යොදන කාලාන්තරය වැඩි කිරීමය.

(1) a හා d වේ. (2) a හා c වේ. (3) b හා c වේ. (4) b හා d වේ.

32. තවාන් මිශ්‍රණය සඳහා යොදාගනු ලබන ද්‍රව්‍යය හා අනුපාත පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බොරළු හා වැලි 1 : 1 අනුපාතය වේ.

(2) වැලි හා කාබනික පොහොර 1 : 2 අනුපාතය වේ.

(3) මතුපිට පස් හා කාබනික පොහොර 1 : 1 අනුපාතය වේ.

(4) මතුපිට පස් හා වැලි 1 : 2 අනුපාතය වේ.

33. පිළිස්සීම මගින් තවානක් ජීවාණුහරණය කිරීමේදී අනුගමනය කරන පියවරයන්හි අනුපිළිවෙල දක්වෙන වරණය තෝරන්න,

a) සකස් කරගත් මිශ්‍රණය හොඳින් තෙත් කිරීම.

b) සුළං හමන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් ගිනි තැබීම.

c) තවාන් මිශ්‍රණය තුළ අර්තාපල් ගෙඩි කීපයක් වැළලීම.

d) පිදුරු හා දහයියා තට්ටු ලෙස මාරුවෙන් මාරුවට තැන්පත් කිරීම.

(1) a, b, c හා d වේ. (2) a, c, d හා b වේ.

(3) a, c, b හා d වේ. (4) a, d, c හා b වේ.

34. පසෙන් ජලය ඉවත් වන ක්‍රම සඳහන් වරණය තෝරන්න,

(1) වාෂ්පීකරණ උත්ස්වේදනය හා ගැඹුරු වැස්සීම වේ.

(2) පාංශු ඛාදනය හා ගැඹුරු වැස්සීම වේ.

(3) වාෂ්පීකරණ උත්ස්වේදනය හා පාංශු ඛාදනය වේ.

(4) සෝදාපාළුව හා මතුපිට අපදාවය වේ.

35. පාංශු ජල සංරක්ෂණ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

a) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.

b) පසට වසුන් යෙදීම.

c) වල්පැළෑටි ඉවත් නොකිරීම.

d) මතුපිටින් ඉවතට ගලායන ජලයට බාධා නොකිරීම.

මේවායින් නිවැරදි වන්නේ,

(1) a හා c වේ. (2) a හා b වේ. (3) b හා c වේ. (4) c හා d වේ.

36. දී ඇති රූප සටහනින් දක්වෙන්නේ කුමන ජල සම්පාදන ක්‍රමය ද?



(1) පිටාර ජල සම්පාදනයයි.

(2) තීරු ජල සම්පාදනයයි.

(3) ඇලි හා වැටි ජල සම්පාදනයයි.

(4) බේසම් ජල සම්පාදනයයි.

37. උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයේ වාසි කිහිපයක් පහත දැක්වේ.

a) ජල සම්පාදන කාර්යක්ෂමතාවය වැඩිය.

b) බෑවුම් සහිත ඉඩම්වලට නුසුදුසුය.

c) පාංශු ඛාදනය සිදුනොවේ.

d) අවශ්‍ය කම්කරු ශ්‍රමය වැඩිය.

මේවා අතුරින් නිවැරදි වනුයේ,

(1) a හා b වේ. (2) b හා c වේ (3) c හා d වේ. (4) a හා c වේ.

38. ජල සම්පාදන ක්‍රමවල හඳුනාගත හැකි මූලික අංගයක් වන්නේ කවරක් ද?

(1) ජල ප්‍රභවය වේ. (2) වගා කර ඇති බෝගය වේ.

(3) පසේ වයනය වේ. (4) බෝගවල වර්ධන අවස්ථාව වේ.

39. පිටාර ජල සම්පාදන ක්‍රමය යොදා ගනු ලබන්නේ කුමන බෝග වගාවන්ට ද?

(1) වී හා මිරිස් වගාවටය. (2) වී හා කෙසෙල් වගාවටය.

(3) කෙසෙල් හා එළඹු වගාවටය. (4) මිරිස් හා එළඹු වගාවටය.

40. රූප සටහනේ දක්වා ඇති ජලවහන කාණු රටාව කුමක්ද?




(1) සමාන්තර කාණු රටාවය.

(2) අහඹු කාණු රටාවය.

(3) හෙරින් බෝන් කාණු රටාවය.

(4) කොඩොල් කාණු රටාවය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**10 ශ්‍රේණිය**

# කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ රටාව කෘෂිකර්මාන්ත සම්බන්ධතාවය මත ගොඩ නැංවීම සඳහා රජය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

i. ආහාර සුරක්ෂිතතාවයට බලපාන ප්‍රධාන සාධක දෙකක් ලියන්න.

ii. a) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ක්ෂේත්‍ර බෝග දෙකක් ලියන්න.

b) හරිත විප්ලවය ආරම්භ වූ වර්ෂය කුමක්ද?

iii. a) පාරජම්බුල කිරණ මගින් බෝගවලට සිදුවන හානියක් ලියන්න.

b) පළමුවන අන්තර් මෝසම් වැසි ලැබෙන කාලසීමාව ලියන්න.

iv. කෘෂි දේශගුණික කලාප වෙන් කිරීම සඳහා යොදාගනු ලබන නිර්ණායක දෙකක් ලියන්න.

v. පසෙහි රසායනික ජීර්ණය සඳහා බලපාන සාධක දෙකක් ලියන්න.

vi. a) පාංශු ආම්ලිකතාවයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

b) ආම්ලිකතාවය උදාසීන කිරීම සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය දෙකක් ලියන්න.

vii. බෝග වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න.

viii. a) රතුකපු මකුණා පාලනයට යොදා ගන්නා උගුල් බෝගය නම් කරන්න.

b) ඖෂධ බෝග දෙකක් ලියන්න.

ix. තවාන් ජීවාණුහරණය කිරීමේ වැදගත්කම් දෙකක් ලියන්න.

x. ඇලිවැටි ජල සම්පාදන ක්‍රමයේ වාසි දෙකක් ලියන්න.

(02) වාරිතාක්ෂණය හා සම්බන්ධ නවීන වගා තාක්ෂණය සහිත කෘෂිකර්මාන්තයක් අප රටෙහි දක්නට ලැබේ.

i. a) එල්ලංගා පද්ධතිය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

b) වැවක බිසෝ කොටුව මගින් කෙරෙන කාර්යය ලියන්න.

ii. a) ලංකාවේ ආරම්භ කරන ලද බහුකාර්ය යෝජනා ක්‍රම දෙකක් ලියන්න.

b) බහුකාර්ය යෝජනා ක්‍රමයකින් බලාපොරොත්තු වන අරමුණු දෙකක් ලියන්න.

iii. a) හරිත විප්ලවය මගින් සිදු වූ වෙනස්කම් හතරක් ලියන්න.

b) සම්ප්‍රදායික නොවන කෘෂි ව්‍යවසායන් දෙකකට උදාහරණ ලියන්න.

(03) දේශගුණික තත්ත්වයට අදාළව බෝග වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

i. a) ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම තුන සඳහන් කරන්න.

b) අධික වර්ෂාපතනයේ අහිතකර බලපෑම් තුනක් ලියන්න.

ii. a) බෝග වගාවට සුළඟින් වන හිතකර බලපෑම් දෙකක් ලියන්න.

b) වැඩි ආර්ද්‍රතාවයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

iii. a) ප්‍රදේශ අනුව උෂ්ණත්ව වෙනස්වීමට බලපාන කරුණු තුනක් ලියන්න.

(04) සාර්ථක බෝග වගාවක් සඳහා පසේ අඩංගු සංඝටක පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත්ය.

i. a) පාංශු පැතිකඩක ඇති කලාප සඳහන් කරන්න.

b) කාබනික ද්‍රව්‍යවල වැදගත්කම් හතරක් ලියන්න.

ii. a) පසේ සිටින මහා ජීවීන් සහ ක්ෂුද්‍ර ජීවීන් සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න.

b) ක්ෂේත්‍රය තුළදී පාංශු වයනය නිර්නය කළ හැකි ක්‍රමයක් ලියන්න.

iii. a) පාංශු වර්ණය කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න.

b) ඔක්සිකාරක තත්ත්වයේ පවතින පසක ඇති අයන වර්ගය කුමක්ද?

(05) නිවැරදි ලෙස බිම් සැකසීම මගින් පසෙහි භෞතික ගුණාංග දියුණු වේ.

i. a) පසෙහි දියුණුවන භෞතික ගුණාංග දෙකක් ලියන්න.

b) භෞතික ගුණාංග දියුණුවීම නිසා බෝගවල මනා වර්ධනයට බලපාන ආකාර දෙකක් ලියන්න.

ii. අතුරුයත් ගෑමේ ක්‍රියාකාරකම් තුනක් ලියන්න.

iii. a) දී ඇති බිම් සැකසීමේ උපකරණ යොදනු ලබන බලය අනුව වර්ග කරන්න.
(උදැල්ල, මුල්ලු වර්ග, සැහැල්ලු යකඩ නගුල, තැටි පෝරුව)

b) මඩ වී බීජ වප්කරයෙන් ලැබෙන වාසියක් ලියන්න.

(06) වස විසෙන් තොරව එළවළු හා පළතුරු ලබාගැනීමට හැකි හොඳම ස්ථානය ගෙවත්ත වේ.

i. තවානක පැළ පේළි අතරට අර්ධ ලෙස පිළිස්සූ දහයියා යෙදීමෙන් ඇතිවන වාසි දෙකක් ලියන්න.

ii. a) තවාන් බඳුන් ලෙස යොදාගනු ලබන ද්‍රව්‍යය හතරක් ලියන්න.

b) පහසුවෙන් දිරාපත්වන ද්‍රව්‍ය තවාන් බඳුන් ලෙස යොදාගැනීමේ වාසි දෙකක් ලියන්න.

iii. a) තවානක් නඩත්තු කිරීමේදී සිදුකරනු ලබන ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

b) තවාන් පැළවලට බහුලව වැළඳෙන රෝගයක් නම් කර එහි රෝග කාරකයා ලියන්න.

(07) බෝග වගාව සඳහා ජලය අත්‍යාවශ්‍ය වන අතර සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට මනා ලෙස ජල කළමනාකරණය කළ යුතුය.

i. ඉසින ජල සම්පාදනයෙන් ඇතිවන වාසි දෙකක් ලියන්න.

ii. a) සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

b) ජල සම්පාදනයේදී යොදා ගන්නා ප්‍රධාන ක්‍රමවලට අමතරව වෙනත් ජල සම්පාදන ක්‍රම දෙකක් ලියන්න.

iii. a) දුර්වල ජලවහනය නිසා ඇතිවන ගැටලු දෙකක් ලියන්න.

b) වැසි ජලය රැස් කිරීමේ වාසි දෙකක් ලියන්න.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | **දෙවන වාර පරීක්ෂණය - 2025**

**10 ශ්‍රේණිය** | **කෘෂි හා ආහාර තාක්ෂණය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 11 - (4) | 21 - (2) | 31 - (1) |
| 2 - (2) | 12 - (4) | 22 - (1) | 32 - (3) |
| 3 - (3) | 13 - (1) | 23 - (3) | 33 - (2) |
| 4 - (2) | 14 - (2) | 24 - (3) | 34 - (1) |
| 5 - (4) | 15 - (3) | 25 - (2) | 35 - (2) |
| 6 - (4) | 16 - (4) | 26 - (1) | 36 - (4) |
| 7 - (3) | 17 - (1) | 27 - (4) | 37 - (4) |
| 8 - (3) | 18 - (1) | 28 - (1) | 38 - (1) |
| 9 - (2) | 19 - (3) | 29 - (2) | 39 - (2) |
| 10 - (1) | 20 - (1) | 30 - (4) | 40 - (3) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) (i) ආහාර සුලභතාවය, ප්‍රවේශවීමේ හැකියාව, ප්‍රයෝජනයට ගැනීම. (ල.1×2=2)

(ii) (a) එළුණු, මිරිස් (ල.½×2=1)

(b) 1960 (ල.1×1=1)

(iii) (a) ශාක සෛල විකෘති ඇති කරයි. (ල.1×1=1)

(b) මාර්තු / අප්‍රේල් (ල.1×1=1)

(iv) භූවිෂමතාවය, පස් වර්ගය, භූමි භාවිතය (ල.1×2=2)

(v) ජලය, $CO_2$, $O_2$ (ල.1×2=2)

(vi) (a) Fe. A1, Mn, විෂවීම (ල.½×2=1)
(පොස්පරස් ලබාගත නොහැකි වීම, බැක්ටීරියා ක්‍රියාකාරීත්වය අඩුවීම)

(b) $CaCO_3$, ඩොලමයිට්, හුණුගල්, ආම්ලික පොහොර දැමීම වැළකීම. (ල.1×½=1)

(vii) (බිම් සැකසීමට, පොහොර යෙදීමට, ශාක බද්ධ කිරීමට, පළිබෝධ පාලනයේදී (ල.1×2=2)

(viii)(a) කපුකිනිස්ස (ල.1×1=2)

(b) හාතවාරිය, නෙල්ලි, ඉඟුරු (ල.½×2=1)

(ix) ව්‍යාධි ජනකයන් විනාශ කිරීම, රෝග කාරක තොර කිරීම. (ල.1×2=2)

(x) තැනිතලා ඉඩම්වලට සුදුසුය, ජලය ප්‍රිය කරන බෝගවලට සුදුසුය, ජලය ප්‍රමාණය අඩුය, ඛාදනය අඩුය, වාෂ්පීකරණය අඩුය (ල.1×2=2)

(අර්ථ දැක්වීමට ලකුණු 01 සහ සාධක වලට ලකුණු ½ x 2)

(02) (i) a) එක වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊළඟ වැවේ ජල පෝෂක ප්‍රදේශය ලෙස පවත්වා ගෙන යාම (ල.1×1=1)

b) වැව් බැම්මට ජලය මගින් ඇතිවන පීඩනය අවම කිරීම (ල.1×1=1)

(ii) a) ගල්ඔය, උඩවලව, නිල්වලා, ලුණුගම් වෙහෙර, මහවැලි, ඉඟිනිමිටිය (ල.1×2=2)

b) කෘෂි නිෂ්පාදන ඉහළ දැමීම, ඉඩම් නොමැති අයට ඉඩම් ලබාදීම, ජනගහනය තුලනය කිරීම, ජල විදුලිය නිපදවීම, රැකියා සැපයීම ආදිය .... (ල.1×2=2)

(iii) a) වැඩි අස්වනු දෙන ප්‍රභේද හඳුන්වා දීම, කෘෂි රසායන හඳුන්වා දීම, යාන්ත්‍රිකරණය වැඩිවීම, කන්න දෙකක් වැඩ කිරීම, ජල ගැලීම් පාලනය (ල.1×2=1)

b) ඉස්සන් වගාව, මීමැසි පාලනය, විසිතුරු මල් වගාව, බිම්මල් වගාව, මත්ස්‍ය වගාව, අමුද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීම.. (ල.1×2=2)

(03) (i) a) මෝසම් වැසි, සංවහන වැසි, වාසුළි වැසි (ල.$1\frac{1}{2}\times1=1\frac{1}{2}$)

b) බිම් සැකසීම අපහසු වීම,
(වර්ෂාපතනය අඩුවීම, පස තද වීම නිසා බිම් සැකසීම අපහසු වීම), බර අඩුවේ, පැළ ඇද වැටීමට ලක්වේ, අස්වනු නෙළීම ප්‍රමාද වේ, බීජ කරලේදීම ප්‍රරෝහනය වීම, පළතුරු වල පැණිරස අඩුවීම. (ල.$1\frac{1}{2}\times1=1\frac{1}{2}$)

(ii) a) මද සුළඟ වායු හුවමාරුව වැඩි කර ප්‍රභාසංස්ලේෂණය වැඩි කරයි. (ල.1×2=2)

b) ශාක රෝග ආසාධන වැඩිවීම, පළිබෝධ ව්‍යාප්තිය වැඩිවීම, ගබඩාවේ පළිබෝධ හානියට ලක්වීම ආදිය.... (ල.1×2=2)

(iii) a) සමකයේ සිට ඇති දුර, උච්චත්වය, මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය, වනගහනය, අභ්‍යන්තර ජලාශ පිහිටීම, මිනිස් ක්‍රියා (ල.1×3=3)

(04) (i) a) A, B, C, R කලාප ලෙස (ල.½×4=2)

b) පාංශු සමූහන, (කැටිති සාදයි), ජලය රඳවා ගැනීම වැඩි කරයි, පෝෂක සංචිතයක් ලෙස ක්‍රියා කරයි, ක්ෂුද්‍ර ජීවීන්ගේ උපස්තරයකි, මතුපිට අපදාවය අඩුකර ඛාදනය අඩුකරයි. ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනයට උපස්තරයකි, ජලවහනය දියුණු කරයි, කලිල ගුණාංග වැඩි කරයි. pH අගය වෙනස් නොකර පවත්වා ගැනීමට උපයෝගී වේ. (ල.½×4=2)

(ii) a) මහා ජීවීන් - කුරුමිණියන්, වෙයන්, කුහුඹුවන්, හැකරැල්ලන්,
ක්ෂුද්‍ර ජීවීන් - ඇල්ගී, බැක්ටීරියා, දිලීර, නේමටෝඩා, ප්‍රොටසෝවාවන් (ල.½×4=2)

b) පස් ස්වල්පයක් අත්ලට ගෙන ජලය යොදා තෙත්කර ගුලිකර මුදුවක් ලෙස සකසා හෝ රෝල් කර වයනය සෙවීම. (ල.1×1=1)

(iii) a) පසේ අඩංගු ඛනිජ වර්ගය, කාබනික ද්‍රව්‍ය ප්‍රවාහනය, පාංශු ජලවහන තත්ත්වය (ල.1×2=2)

b) $Fe^{+++}$ (ල.1×1=1)

(05) (i) a) පාංශු ව්‍යුහය, පාංශු වාතනය, පසෙහි ජලවහනය දියුණු වීම. (ල.1×2=2)

b) * මූල මණ්ඩලයේ වර්ධනය හොඳින් සිදුවීම.
* ජලය ලබා ගැනීම.
* පෝෂක අවශෝෂණය හොඳින් සිදුවීම.
* ශ්වසන ක්‍රියාවලිය නිසි පරිදි සිදුවීම (ල.1×2=2)

(ii) * වල් මර්ධනය කිරීම.
* පැළ අවට පස් බුරුල් කිරීම.
* පසට පොහොර මිශ්‍ර කිරීම
* පැළයේ මුලට පස් එකතු කිරීම සහ කාණුවල පස් ඉවත් කිරීම. (ල.1×3=3)

(iii) a)

| | | |
|---|---|---|
| අතින් ක්‍රියාකරන | සත්ත්ව බලය | යන්ත්‍ර බලය |
| උදැල්ල | සැහැල්ලු යකඩ නගුල | තැටි පෝරුව |
| මුල්ලු වර්ග | | |

(ල.½×4=2)

b) * පේළියට වී වැපිරීම.
* අවශ්‍ය බීජ වී ප්‍රමාණය අඩුවීම.
* ඉඩකඩ ප්‍රශස්තව පවත්වා ගැනීම. (ල.1×1=1)

(06) (i) වල්පැළෑටි අවම කර ගැනීමට හැකිවීම.
* දිලීර රෝග පාලනය වීම. (ල.1×2=2)

(ii) a) පොල්කටු, හිස් යෝගට් කෝප්ප, කඩදාසි බඳුන්, කෙසෙල් පට්ට බඳුන්, හිස් කිරිහට්ටි ආදිය (ල.½×4=2)

b) * පරිසර දූෂණය අවම වීම.
* වියදම අවම වීම
* දිරාපත් වීම නිසා කාබනික ද්‍රව්‍යය බවට පත්වීම (ල.1×2=2)

(iii) a) * වසුන් යෙදීම හා වසුන් ඉවත් කිරීම
* සෙවණ සැපයීම
* පොහොර යෙදීම
* පැළ දෘඩි කිරීම
* ජල සම්පාදනය
* වල් මර්ධනය
* රෝග සහ පළිබෝධ පාලනය
* පැළ ගැලවීම (ල.½×4=2)

b) * දියමලන් කෑම රෝගයට (ල.1×1=1)
* දිලීර (පීතියම්). රෝග කාරකයට (ල.1×1=1)

(07) (i) * බෝගයේ මූල මණ්ඩලයට මෙන්ම පත්‍රවලට ජලය ලැබීම.
* බෑවුම් සහිත ඉඩම්වලට ද සුදුසුය.
* පාංශු ඛාදනය සිදුනොවේ.
* අවශ්‍ය ජල ප්‍රමාණය අඩුය.
* පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍යය ජලය සමඟ යෙදිය හැකිවීම
* ජල සම්පාදන කාර්යක්ෂමතාවය වැඩිය (ල.1×2=2)

(ii) a) * වගා කර ඇති බෝගය.
* බෝගයේ වර්ධන අවස්ථාව.
* ජලය සැපයීමේ අරමුණු
* පසේ වයනය (ල.1×2=2)

b) * ඉවත දමන සේලයින් බෝතල් මගින් ජලය සැපයීම.
* බෙගා බෝතල් මගින් ජලය සැපයීම.
* මල් බාල්දි, කළගෙඩි මගින් ජලය සැපයීම. (ල.1×2=2)

(iii) a) * පාංශු වාතය දුර්වල වීම.
* නිර්වායු තත්ත්ව ඇතිවීම.
* ශාක මැළවීම, මියයාම.
* ශාක මුල් මතුවීම නිසා ශාක ඉදිරී වැටීම.
* මඩවීම - උපකරණ භාවිතය අපහසු වීම.
* දිලීර රෝග වැළඳීම. (ල.1×2=2)

b) * අඩු වියදමකින් ගුණාත්මයෙන් ඉහළ ජලය ලබා ගැනීමට හැකිවීම
* ගෘහස්ථ පරිභෝජනය හා ගොවිතැන් කටයුතුවලට ලබා ගැනීමට හැකිවීම.
* ජලය රැස් කිරීම සඳහා දේශීය තාක්ෂණය හා සම්පත් යොදාගත හැකිවීම. (ල.1×2=2)